# කොටපොල ප්‍රාදේශීය සභාව.

## මාතර දිස්ත්‍රික්කය.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 ඔක්තෝබර් 21 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 දෙසැම්බර් 14 වන දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 මතය

මෙම වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති කොටපොල ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් 05 දින මිලදී ගන්නා ලද රු.345,000 ක් ව ට්‍රැක්ටර් ට්‍රේලරයෙ වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් හා ඔක්තෝබර් මාස වෙනුවෙන් ලැබිය යුතු උසාවි දඩ ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 24 දින දේශීය ණය සහ සංවර්ධන අරමුදලෙන් ලබාගත් රු.5,000,000 ක ණය මුදල සමාලෝචිත වර්ෂය අවසානයට ශේෂ තහවුරුව අනුව රු.4,384,219 ව තිබූ අතර එකී ණය මුදල ගිණුම් ගතවී නොතිබුණි.

(ඈ) වාර්ෂික ආදායම් සාරාංශ (ප්‍රා.ස.19) සකස් කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලට දායක වශයෙන් ගෙවිය යුතු රු.3,783,084 ක දායක මුදල් ගිණුම්ගත කර නොතිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 06 කට අදාල මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු.36,592,465 ක් වූ අතර උපයෝගී ලේඛණ අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.23,387,327 ක් වූයෙන් වෙනස රු.13,205,138 ක් විය.

1.3.3 අවිනිශ්චිත ගිණුම්.

සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන රු.1,154,043 ක් වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය නිරවුල් කර නොතිබුණි.

1.3.4 ගෙවිය යුතු ගිණුම්.

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම ර.4,883,747 ක් විය.

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීම නිසා රු.40,331,317 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.6 අනුකූල නොවීම්

පහත සඳහන් නීති,රීති, රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරන තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදි නිරීක්ෂණය විය.

| නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව. | අනුකූල නොවීම. |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>මු.රෙ.1645, මු.රෙ.1646 | වාහන වල ධාවන සටහන් නිසි පරිදි සම්පූර්ණ කර මාසික සාරාංශ සමඟ ඊළඟ මාසයේ 15 දිනට පෙර විගණකාධිපති වෙත එවිය යුතු වුවත් සභාවට අයත් වාහන 07 ක් සම්බන්ධයෙන් එසේ කර නොතිබුණි. |
| (ආ) 2002 නොවැම්බර් 28 දිනැති භාණ්ඩාගාර ලේකම්ගේ අංක අයිඒඅයි 2002/2 දරණ චක්‍රලේඛය | පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛණයක් පවතවා නොතිබුණි. |
| (ඇ) රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම්ගේ 2005 මාර්තු 31 දිනැති අංක 2005/8 දරණ චක්‍රලේඛය | චක්‍රලේඛයේ 11.5 ඡේදය පරදි දේපල ණය සඳහා අයකරන පොලිය හා නිලධාරියාගෙන් අයකරන 4% පොලී අනුපාතිකය අතර වෙනස රජය විසින් දැරිය යුතු වුවද ඉකුත් වර්ෂ 04 ක සිට සභාවට අයවිය යුතු රු.149,089 ක මුදල අයකරගෙන නොතිබුණි. |

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,111,988 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 14,095,883 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාල ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු 2011 මාර්තු 14 දිනැති මාගේ ලිපියට අනුව නියමිත ආකෘතියක ඉදිරිපත් කරන ලෙස සභාපතිවරයාගෙන් ඉල්ලා තිබූ නමුත් තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තබූ හිඟ ආදායම් ප්‍රකාශ අනුව 2010 දෙසැම්බර් 31 දිනට පැවති තත්ත්වය ඉකුත් වර්ෂය සමඟ සසඳා සාරාංශ කර පහත දක්වා ඇත.

| විස්තරය | හිඟ ආදායම් 2010 | 2009 | වැඩිවීමේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| | රු. '000 | රු. '000 | % |
| වරිපනම් හා බදු | 432 | 301 | 43.5 |
| බදු කුලී | 356 | 340 | 4.71 |
| වෙනත් | 28,140 | 20,373 | 38.12 |

### 2.2.2 හිඟ බදු හා ගාස්තු

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව අයවිය යුතු රු.432,085 ක බදු හා ගාස්තු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 හා 159 වගන්තිවල විධිවිධාන අනුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.3 කඩ කාමර බදු.

(අ) සභාව සතු දෙනියාය බස් නැවතුම්පොල කඩ කාමර 21 ක් වූ අතර එකී කඩකාමර බදුදීම් සම්බන්ධයෙන් 2011 නොවැම්බර් 03 දිනැති භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ කරුණු මෙසේය.

(i) බදු ගිවිසුමේ කොන්දේසි අංක 10 ට පටහැනිව කඩ කාමර 04 ක් බදුකරුවන් විසින් වෙනත් පුද්ගලයන් වෙත අතුරු බදු දී තිබූ අතර සභාවේ මාසික කුලියට වඩා වැඩි අගයන්ට එකී කඩ කාමර බදුදී තිබුණි.

(ii) බදු ගිවිසුමේ කොන්දේසි අංක 12 ට පටහැනිව කඩ කාමර 05 ක අනවසර ඉදිකිරීම් සිදුකර තිබුණි.

(iii) දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/ප.පා.කො./2010/01 දරණ චක්‍රලේඛය පරිදි බදුදී තිබූ කඩකාමර සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

(ආ) මෙම බස් නැවතුම් පොලෙහි කඩකාමර හයකින් 2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.48,705 ක හිඟ බදු සම්බන්ධයෙන් බදු ගිවිසුමේ කොන්දේසි අංක 04 පරිදි කටයුතු කර නොතිබුණි.

2.2.4 විනෝද බදු

1995 සිට 2000 දක්වා සිනමාහලකින් අයවිය යුතු රු.419,132 ක විනෝද බදු මුදල් 2010 දෙසැම්බර් 31 දින දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.5 උසාවි දඩ මුදල්

විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණයකින් 2010 දෙසැම්බර් 31 දින දක්වා අයකර තිබුණු රු.671,365 ක් වූ දඩ මුදල් ප්‍රධාන ලේකම් වෙතින් සභාවට ලැබිය යුතුව තිබුණි.

2.2.6 මුද්දර ගාස්තු

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් රු. 1,268,588 ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

2.3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| වියදම් විෂයය | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 12,258 | 13,117 | (859) | 12,777 | 11,514 | 1,263 |
| අනෙකුත් | 8,186 | 7,792 | 394 | 8,353 | 5,801 | 2,552 |
| උප එකතුව | 20,444 | 20,909 | (465) | 21,130 | 17,315 | 3,815 |
| ප්‍රාග්ධන වියදම් | 10,637 | 11,491 | (854) | 25,330 | 14,771 | 10,559 |
| එකතුව | 31,081 | 32,400 | (1,319) | 46,460 | 32,086 | 14,374 |

2.4 මානව සම්පත් කළමනාකරණය

2.4.1 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික | 01 | 01 |
| ද්විතීයික | 13 | 08 |
| ප්‍රාථමික | 35 | 21 |
| වෙනත් (අනියම්/කොන්ත්‍රාත්) | - | 13 |
| | 49 | 43 |

(අ) සමාලෝචිත වර්ෂයේ කාර්ය මණ්ඩල වැටුප් පිරිවැය රු.13,116,868 ක් වුවද පළාත් පාලන කොමසාරිස් විසින් ප්‍රතිපූර්ණය කර තිබුණේ ඉන් රු.8,337,500 ක් පමණක් හෙයින් රු.4,779,368 ක් වූ වෙනස සභා අරමුදලට වැය බරක් වී තිබුණි.

(ආ) භාණ්ඩාගාර ලේකම්ගේ 2002 ජනවාරි 03 හා 2006 අප්‍රේල් 10 දිනැති කළමනාකරණ සේවා අංක 14 හා අංක 28 දරණ චක්‍රලේඛ මගින් පළාත් පාලන ආයතනවල අනියම්, ආදේශක හා කොන්ත්‍රාත් සේවකයින් බඳවා ගැනීම අත්හිටුවා ඇතත් එකී විධිවිධාන වලට පටහැනිව සේවකයින් 13 දෙනෙකු ආදේශක හා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන රු.213,899 ක් වැටුප් වශයෙන් සභා අරමුදලින් ගෙවා තිබුණි. මෙම චක්‍රලේඛයේ උපදෙස් අභිබවා යමින් බඳවා ගැනීම් සිදුකල හොත් ආයතන ප්‍රධානියා ඒ සඳහා පුද්ගලිකව වගකීමෙන් බැඳී සිටින බවද අවධාරණය කර තිබුණි.

2.5 වත්කම් කළමනාකරණය.

අයවීමට ඇති සේවක ණය

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂ වල එකතුව රු.2,165,117ක් වූ අතර අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවීම් හිඟහිටි ගිණුම් ශේෂ වල එකතුව රු.46,662 ක් විය.

2.6 බැකෝ ලෝඩර් යන්ත්‍රය.

බැකෝ ලෝඩර් යන්ත්‍රයක් (අංක SPZA -0063) රු. 8,000,000 ක මුදලකට 2009 වර්ෂයේදී මිලදී ගෙන තිබුණි.
මේ සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු මෙසේය.

(i) යන්ත්‍රය මිලදී ගැනීම සම්බන්ධයෙන් 2011 ජනවාරි 12 දිනැතිව නිකුත් කල විගණන විමසුමෙන් පෙන්වා දුන් පරිදි ලැබී නොතිබූ මල්ටි බකටය හා ඩික් එක සහත බැකෝ අත 2011 නොවැම්බර් 08 දින වන විටද සභාව වෙත ලබා ගැනීමට වගකිව යුතු නිලධාරීන් කටයුතු කර නොතිබුණි.

(ii) සැපයුම්කරු විසින් යන්ත්‍රයෙන් ගලවා ඉවත්කරගෙන ගිය අමතර කොටස් සභාව වෙත ලැබී නොතිබූ බව සභා ලේකම්වරයගේ 2010 දෙසැම්බර් 24 දිනැති ලිපිය අනුව අනාවරණය විය. සපයා තිබූ බැකෝ අතෙහි පැස්සුම් සයල්ල ගැලවී පුපුරා ගොස් ඇති

බවත් රථය වැඩෙහි යෙදවීම අපහසු වී ඇති බවත් සභාපතිවරයාගේ 2011 අගෝස්තු 19 දිනැති ලිපිය අනුව සැපයුම්කරු වෙත දන්වා තිබුණෙන් යන්ත්‍රයේ ක්‍රියාකාරීත්වය දුර්වල තත්ත්වයක තිබූ බව නිරීක්ෂණය විය.

(iii) යන්ත්‍රය 2010 ජූලි 01 සිට 2011 සැප්තැම්බර් 30 දින දක්වා මාස 16 ක කාල පරිච්ඡේදය තුල යන්ත්‍ර පැය 1380 ක් ධාවනය කර තිබූ අතර මෙහෙයුම් අලාභය රු. 437,597 ක් විය.

(iv) සැපයුම්කරු සමඟ සභාව ඇතිකර ගන්නා ලද ගිවිසුම් ගත කොන්දේසි පරිදි නියමිත උපාංග සපයා නොතිබීම, අමතර කොටස් සැපයීම හා අලුත්වැඩියාවන් ප්‍රමාද කිරීමත් යන්ත්‍රයෙන් අපේක්ෂිත ප්‍රයෝජන නොලැබීමත් මත සැපයුම්කරුට එරෙහිව නීතිමය පියවර ගැනීමක් සිදුව නොතිබුණි.

2.7 අනවසර ඉදිකිරීම්

වාර්තා වී තිබූ අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් නිවේදන නිකුත් කිරීම හැර වෙනත් නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොමැති බව ඉදිකර තබූ ගොඩනැගිලි පිළිබඳව 2011 නොවැම්බර් 08 දිනැති භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

දෙනියාය, රක්වාන පාර, නො.35 දරණ ස්ථානයේ වර්ග මීටර් 248.4 ක ප්‍රමාණයේ තෙමහල් ගොඩනැගිල්ල සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන ගැසට් නිවේදනයේ 6 (ii) ඡේදය පරිදි ආවරණ අනුමැතිය දීමේදී අයකරගත යුතු රු.496,800 ගාස්තු අයකර නොතිබුණි.

2.8 මෙහෙයුම් අකාර්යක්ෂමතා.

(අ) ඉකුත් වර්ෂයේදී පෙන්වා දෙන ලද කුඩාඑදෙනිය ප්‍රජා ශාලාව, යහල්වලකඩ ප්‍රජා ශාලාව හා පින්නදෙනිය ප්‍රජා ශාලා අළුත්වැඩියා කිරීම සඳහා රු.547,382 ක් වියදම් දරා තිබුණද ඊට අදාල ඉඩම් මේ වන තෙක් සභාව සතුකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ලංකා විදුලි බල මණ්ඩලයෙන් රු.20,300 ක මුදලක් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.9 අභ්‍යන්තර විගණනය

සභාව තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3. පද්ධති හා පාලන

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය